මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சு

Ministry of Public Security and Parliamentary Affairs

2024

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2024

18 වන මහළ, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

පටුන

	පිටු අංකය
01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	01 - 05
1.1 හැඳින්වීම	01
1.2 දැක්ම, මෙහෙවර, අරමුණු	02 - 03
1.3 ප්‍රධාන කාර්යයන්	04
1.4 සංවිධාන සටහන	05
1.5 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන	05
02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	06 -11
03. පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශන	12 - 17
04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක	18
05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු	18 - 22
06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ	22
විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව	23 - 38
07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව	39 - 45

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

2020.11.20 දිනැති අංක 2202/25 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් එතෙක් ආරක්ෂක අමාත්‍යාංශය යටතේ අභ්‍යන්තර ආරක්ෂක අංශය කැබිනට් අමාත්‍යාංශයක් ලෙස විෂය පථය සංශෝධනය කර මහජන ආරක්ෂක අමාත්‍යාංශය පිහිටුවනු ලැබීය. එදින සිට අවස්ථා කිහිපයකදී අමාත්‍යාංශයීය විෂය පථය සංශෝධනය විය. රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව 2024 වර්ෂයට සකස් කරන ලද සැලසුම්වලට අනුව මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් පවත්වා ගනිමින් රට තුළ සියලුම පුරවැසියන්ට බියෙන් සැකෙන් තොරව නිදහසේ ජීවත්වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමත්, පුරවැසි අනන්‍යතාවය තහවුරු කිරීමත්, දේශීය හා විදේශීය පුද්ගලයන් සඳහා ආගාමික හා විගාමික කාර්යයන් සඳහා පහසුකම් සැලසීමත්, ජාතික ආර්ථිකයට ශක්තියක් වන ලෙසට රටතුල ක්‍රියාත්මක රාජ්‍ය නොවන සංවිධාන ජාලය නියාමනය කිරීමත්, මත්ද්‍රව්‍ය උවදුර මැඩලීම ද ප්‍රධාන වශයෙන් අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන මගින් සිදු කෙරේ.

ඒ අනුව මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයට පැවරුණු ප්‍රධාන වගකීම් වන පුරවැසියන්ට බියෙන් සැකෙන් තොරව ජීවත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම, පුරවැසි අනන්‍යතාවය දේශීයව හා විදේශීයව සහතික කිරීම, මත්ද්‍රව්‍ය උවදුර හා අන්තරායකර ඖෂධ දුර්භාවිතය මැඩපැවැත්වීම සහ රටතුල ක්‍රියාත්මක ජාත්‍යන්තර හා දේශීය රාජ්‍ය නොවන සංවිධාන රාජ්‍ය ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක කරවීම තුලින් නීති ගරුක පුරවැසියන්ගෙන් යුක්ත සමාජයක් ස්ථාපිත කිරීම සඳහා අමාත්‍යාංශය විසින් සම්පාදනය කරදෙනු ලබන ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන්ට අනුව ක්‍රියා කිරීමට සියළු ආයතන කටයුතු කරමින් සිටී.

විශේෂයෙන් මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය මේ වන විට දීර්ඝ කාලයක සිට ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන්ගේ නොවිසඳී පැවති උසස්වීමේ හා පුහුණු කිරීමේ ගැටලු විසඳීමටද ඔවුන් සඳහා තාක්ෂණික හා යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි ලබාදීමටද සුවිශේෂී අවධානයක් යොමුකරමින් කටයුතු සම්පාදනය කරමින් සිටින අතර ඒ තුළින් මහජන හිතකාමී සේවාවක් ශ්‍රී ලංකා පොලිසිය තුළින් ගොඩනැගීමට අපේක්ෂා කරනු ලැබේ.

සමස්තයක් ලෙස සලකා බැලීමේදී මහජන ආරක්ෂාව සුරක්ෂිත කිරීමට හා පුද්ගල අනන්‍යතාවය සහතික කරන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් පවත්වා ගැනීම පිණිස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සියළු ආයතන කටයුතු කරනු ලබමින් සිටී. ඒ සඳහා අවශ්‍ය සැලසුම් සකස් කරමින් හා ක්‍රියාත්මක කිරීම් විධිමත් කරමින් අමාත්‍යාංශයේ ප්‍රධාන කර්තව්‍යයයන් ඉටු කරමින් රටේ සංවර්ධන කාර්යයට සහාය දැක්වීමට මෙම අමාත්‍යාංශය කටයුතු කරමින් සිටී. ඒ සඳහා අමාත්‍යාංශ විෂය පථයට අදාලව ප්‍රතිපත්ති සැකසීම, මහපෙන්වීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, කාර්ය සාධන ඇගයීම සහ පසුවිපරම් කටයුතු සඳහා අවශ්‍ය සියලු කටයුතු ඉටුකරනු ලබයි.

1.2. දැක්ම

“පුරවැසි අනන්‍යතාවය තහවුරු කල ආරක්ෂිත, සුරක්ෂිත, සාමකාමී සහ මත්ද්‍රව්‍යයෙන් තොර ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීම”

1.2. මෙහෙවර

“අපරාධ ත්‍රස්තවාදය, මත්ද්‍රව්‍ය උවදුර තුරන්කර නීතිය හා සාමය සුරැකි නීත්‍යානුකූල පුරවැසියන්ගේ අනන්‍යතාවය තහවුරු කරන රටක් නිර්මාණය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කර ක්‍රියාත්මක කිරීම”

1.2 අරමුණු

- සියලුම රටවැසියන්ගේ ආරක්ෂාව සහ අනන්‍යතාවය තහවුරු කර ජීවත්වීමට සුදුසු පරිසරයක් බිහිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා මගපෙන්වීම.

- පොලිස් සේවාවේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වැඩිදියුණු කිරීමට නවීන තාක්ෂණික උපාංග හා පුහුණුව ලබාදීම මඟින් පොලිස් නිලධාරීන්ගේ වෘත්තීයමය භාවය ඉහළනැංවීම.

- ජන ජීවිතය සුරක්ෂිතව පවත්වා ගෙන යාමට හැකිවන පරිදි අන්තවාදය, ත්‍රස්තවාදී කටයුතු, මංකොල්ලකෑම්, මිනීමැරුම්, පාතාල ක්‍රියා, මත්ද්‍රව්‍ය උවදුර විනාශ කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා පොලීසියේ බුද්ධි අංශය හා ක්‍රියාකාරී කොට්ඨාශ ශක්තිමත් කර පවත්වාගෙනයාම.

- ශ්‍රී ලංකා පොලීසියේ යටිතල පහසුකම් සංවර්ධනයට, අදාල සැලසුම් සකස්කර එහි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අධීක්ෂණ හා පසුවිපරම් ක්‍රියාවලිය ශක්තිමත්ව පවත්වාගෙනයාම.

- රථවාහන මඟින් සිදුවන අනතුරු, ආබාධිත තත්ත්වයන්, මරණ අවම කරගැනීම උදෙසා රථවාහන හැසිරවීම, පාලනය හා නියාමනයට නවීන තාක්ෂණික යෙදවුම් හා භාවිතයන් හඳුන්වාදීම.

- පුද්ගල අනන්‍යතාවය අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව දේශීයව හා විදේශීව තහවුරු කිරීමට පසුබිම සැකසීම.

- මත්ද්‍රව්‍ය උවදුර සහ අන්තරායකර ඖෂධ දුර්භාවිතය මැඩලීමට සුදුසු උපායමාර්ගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ශ්‍රී ලංකාව තුළ ක්‍රියාකාරීව පවතින සියළුම රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය ප්‍රතිපත්තීන් තුළ එකී සංවිධාන ක්‍රියාත්මක වන බව නිශ්චය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- මහජන ආරක්ෂාව තහවුරු කිරීම ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා පොලිස් සේවයේ සේවා මට්ටම ඉහළ නැංවීම.

- සමාජය මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් කර ගැනීමේ වැඩපිළිවෙල ප්‍රජා මට්ටමෙන් මෙන්ම පාසල් හා අධ්‍යාපන ආයතනවල දරුවන් රාජ්‍ය හා පෞද්ගලික සේවා ස්ථාන ඉලක්කගත වැඩසටහන්, ආගමික මධ්‍යස්ථාන, සමාජ සංවිධාන රාජ්‍ය හා පෞද්ගලික අංශ සමගින් ක්‍රියාත්මක කිරීම.

- අභ්‍යන්තර ආරක්ෂාව තහවුරු කිරීම ඉලක්ක කර ගනිමින් අන්තවාදය හා ත්‍රස්තවාදී කටයුතු වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.

- ජන ජීවිතය සුරක්ෂිතව පවත්වා ගැනීම සඳහා මංකොල්ලකෑම්, මිනීමැරීම්, සමාජ විරෝධී ක්‍රියාවන් හා අපරාධ මර්දනය කිරීම හා මැඩපැවැත්වීම.

- රටේ සියළුම පුරවැසියන්ට, විශේෂයෙන්ම කාන්තාවන්ට හා දරුවන්ට නිදහසේ තම ජීවිත ගත කිරීමට අවශ්‍ය රැකවරණය සෑම විටම පවත්වාගෙන යෑම.

- රථ වාහන භාවිතයේදී මාර්ගවල සිදුවෙන අක්‍රමිකතා මෙන්ම මාර්ග අනතුරුවලින් සිදුවන මරණ, ආබාධ, රෝහල් ගත වීම් වළක්වා ගැනීම හා අවිධිමත් හා නොසැලකිලිමත් රිය පැදවීම්, මංතීරු හා මාර්ග සංඥා උල්ලංඝනය කිරීම මෙන්ම විශේෂයෙන් නාගරික ප්‍රදේශවල අවිධිමත් රිය පැදවීම හා මග දෙපස රථ වාහන නතරකර තැබීම් නිසා ඇතිවන මාර්ග තදබදය අවමකර ක්‍රමවත් රථවාහන ධාවන නියාමන ක්‍රමවේදයක් හා නීතිමය රාමුවක් ක්‍රියාත්මක කිරීම සඳහා රථවාහන පොලීසිය ප්‍රතිසංවිධානය කර නවීන තාක්ෂණ හා ක්‍රමෝපායන් යොදාගනිමින් නවීකරණය කිරීම.


- ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ රාජ්‍ය නොවන සංවිධානවල කාර්යයන් සම්බන්ධීකරණය කරමින් රටේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායක වීමට අවස්ථාව සැලසීම.

- ආගමන හා විගමන පරිපාලන කටයුතු නවීකරණය හා කාර්යක්ෂම සේවාවක් ලෙස පවත්වා ගැනීම

- පුද්ගල අනන්‍යතාවය දේශීයව තහවුරු කිරීමට සහතිකවන පසුබිම සැකසීම නවීකරණය හා කාර්යක්ෂම සේවාවක් ලෙස පවත්වා ගැනීම

- මත්ද්‍රව්‍ය උවදුර සහ අන්තරායකර ඖෂධ දුර්භාවිතය මැඩලීමට සුදුසු උපායමාර්ගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

1.4. සංවිධාන සටහන



1.5 අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ආයතන

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය යටතේ පහත ආයතන ක්‍රියාත්මක විය.

i. ශ්‍රී ලංකා පොලීසිය
ii. විශේෂ කාර්ය බලකාය
iii. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය
iv. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
v. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
vi. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

- **මානව සම්පත් සංවර්ධනය**

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ විෂය පථය පුළුල් වීමත් සමඟ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 476 ක කාර්යය මණ්ඩලයක් අනුමත කරන ලදි. ඒ අනුව සංවර්ධන නිලධාරීන් 382 ක් අනුමත කර දී ඇති අතර ඉන් සංවර්ධන නිලධාරීන් 342 ක් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙත අනුයුක්ත කිරීම පිණිස අනුමත කර දී ඇත. ඒ අනුව අමාත්‍යාංශයේ සමස්ත කාර්ය මණ්ඩලය 134 ක් වන අතර සමස්ත කාර්යය මණ්ඩල අවශ්‍යතාවයෙන් 95% ක් 2024 වර්ෂය අවසන් වන විට සම්පූර්ණ කර ගැනීමට හැකියාව ලැබී ඇති අතර අමාත්‍යාංශයේ කාර්යභාරය හැකි උපරිම කාර්යක්ෂමතාවයකින් පවත්වා ගෙන යනු ලබයි. එමෙන්ම වැටුප් රහිත දේශීය හා විදේශීය නිවාඩු ඉල්ලීම් යටතේ අමාත්‍යාංශයේ සිවිල් නිලධාරීන් දෙදෙනෙක් සඳහා දේශීය නිවාඩු ලබා දී ඇත.

- **පුහුණු පාඨමාලාවලට සම්බන්ධ කිරීම...**

අමාත්‍යාංශයේ පොදු දැක්ම ළඟා කරගැනීමට හැකිවන සේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය දැනුම. ආකල්ප හා කුසලතා සංවර්ධනයට පුහුණුවීම් ලබා දීම අත්‍යවශ්‍ය කරුණකි. ඒ අනුව දැනුම, ආකල්ප, නිපුණතා හා ධනාත්මක චින්තනය සංවර්ධනය උදෙසා අමාත්‍යාංශ නිලධාරීන් විවිධ පුහුණු වැඩසටහන්වලට සම්බන්ධ කරන ලදී. අමාත්‍යාංශ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය උදෙසා දේශීය වශයෙන් පුහුණුව ලබා දෙන ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් කාර්යාල ක්‍රම සම්බන්ධව, අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම, විගණන ක්‍රමවේද පිළිබඳ, පුද්ගල ලිපි ගොනු නඩත්තුව හා ගිණුම් ක්‍රම යන විෂයන් ආවරණය වන පරිදි මාණ්ඩලික නිලධාරීන් ද ඇතුළුව සමස්ථ නිලධාරීන් සඳහා රු. 668,000.00 වැය කරමින් පුහුණු අවස්ථා ලබා දී ඇත. එමෙන්ම දෙමළ භාෂා ප්‍රවීණතා පුහුණුව අවශ්‍ය නිලධාරීන් සඳහා ද පුහුණු අවස්ථා සලසා දීමට ක්‍රියා කර ඇත.

- **විශේෂිත වූ කාර්යයන් විධිමත්ව ඇරඹීම උදෙසා...**

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ හා ඒ යටතේ ඇති ආයතනවල සිදුකරනු ලබන කාර්යයන් විධිමත්ව හා විනිවිදභාවයකින් යුතුව නෛතික රාමුවක් තුළ සිදුකිරීම සඳහා මානව සම්පත් වර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, ප්‍රසම්පාදන කටයුතු විධිමත් කිරීම සහ සුහසාධනය ඉහළනැංවීම, ආදී විවිධ කාර්යයන් පාදක කර ගනිමින් 2024 වර්ෂයේ අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 45 ක් ඉදිරිපත් කර ඇත. එම පත්‍රිකා සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතීන් හා නිර්දේශයන් අනුව අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල කාර්යයන් විධිමත්ව සිදු කිරීම සඳහා අවශ්‍ය පියවරයන් ගනිමින් සිටී.

- **මත්ද්‍රව්‍ය භාවිතා කරන රියදුරන් හඳුනා ගැනීම සඳහා අවශ්‍ය වන පරීක්ෂණ කට්ටල ශ්‍රී ලංකා පොලිසිය වෙත ලබා දෙමින්...**

මත්ද්‍රව්‍ය භාවිතාකර රිය ධාවනය කරනු ලබන රියදුරන් පරීක්ෂා කිරීමට අදාල නියමු ව්‍යාපෘති වාර්තාව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් සකස් කර ඇත. එහෙත් නියමු ව්‍යාපෘතියට යොදා ගන්නා ලද උපකරණ සඳහා නෛතික භාවය මේ වන තෙක් ලැබී නොමැති බැවින් එම උපකරණ නැවත මිල දී ගැනීම ප්‍රයෝගික නොවන බව හා එම උපකරණ සඳහා නෛතිකභාවය ලැබීමෙන් අනතුරුව නැවත මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සුදුසු බව 2024.08.14 දින පැවති මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා රැස්වීමේ දී තීරණය කර ඇත.

- **ළමා අපචාර හා අපයෝජන තුරන් කිරීම සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින්...**

මෙම අමාත්‍යාංශයේ මෙහෙය වීම යටතේ ළමා කාන්තා කටයුතු අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව, අධිකරණ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලිසිය, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහ අදාල වෙනත් අංශ සම්බන්ධ කර ගනිමින් ළමා අපචාර මැඩ පැවැත්වීම සම්බන්ධ තීන්දු තීරණ ගනිමින්, හා ඊට අදාළ ක්‍රියාමාර්ගයන් වෙත අවධානය යොමු කරන ලදි. ඒ අනුව, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය විසින් සකස් කරන ලද කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂණ මණ්ඩලයේ යෝජනා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ 2023-2027 ක්‍රියාකාරී අංක 1.6 හි අවශ්‍යතා සම්පූර්ණ කිරීමට අදාලව ළමා අපචාර සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව වැරදි විමර්ශනය කිරීම හා නඩු පැවරීමට අදාලව ශ්‍රී ලංකා පොලිසියයේ ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යාංශයට සම්මත මෙහෙයුම් පටිපාටියක් සකස් කිරීම (Japanese Government Agency - Sri Lanka Office) ජයිකා ශ්‍රී ලංකා ආයතනයේ සහයෝගයෙන් ආරම්භ කරන ලදි. මේ සඳහා ක්‍රියාකාරී කමිටුවක් සකස් කරන ලද අතර අදාල කමිටු සමාජිකයන්ගේ සහභාගීත්වයෙන් පළමු වැඩමුළුව 2024.07.19 හා දෙවන වැඩමුළුව 2024.09.06 දිනවල පවත්වා සම්මත මෙහෙයුම් පටිපාටිය කෙටුම්පත් කිරීම ආරම්භ කරන ලදි.

- **පොලිස් ස්ථාන වල ස්ථාපිත කර ඇති ළමා හා කාන්තා කාර්යාංශ වල භෞතික පහසුකම් හා පොදු පහසුකම් වැඩි දියුණු කිරීම...**

එක්සත් ජාතින්ගේ ජනගහන අරමුදලේ දායකත්වයෙන් ළමා හා කාන්තා කාර්යාංශ භාරයට ගනු ලබන ළමුන් සහ වින්දිතභාවයට පත්වන කාන්තාවන් වෙනුවෙන් මූලික අවශ්‍යතා සපුරා ගත හැකි අයුරින් මූලික පහසුකම් සහිතව වින්දිත තැනැත්තන්ගේ ගරුත්වය සහ පෞද්ගලිකත්වය ආරක්ෂා වන පරිදි ස්වාධීන පිවිසුමක් සහිතව කාර්යාල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. මූලික අදියර වශයෙන් කොළඹ, මහනුවර, නුවරඑළිය, පුත්තලම, මුලතිව්, මඩකලපුව, යාපනය යන දිස්ත්‍රික්කයන්හි තෝරාගත් පොලිස් ස්ථාන 07 ක කටයුතු අවසන් කර ළමා හා කාන්තා කාර්යාංශය වෙත භාර දී ඇත.

දෙවන අදියර ලෙස තවත් දිස්ත්‍රික්ක හතක් නියෝජනය වන පරිදි ළමා හා කාන්තා කාර්යාංශවල භෞතික පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අදාල ස්ථාන හඳුනාගැනීමේ කටයුතු හා එම කාර්යාංශ වලට අනුයුක්තව රාජකාරී කරනු ලබන පොලිස් නිලධාරීන් පුහුණු කිරීමටද ඉදිරියේ දී සැලසුම් කර ඇත.

- **නියෝජ්‍ය පොලිස්පති කොට්ඨාශ සීමා නිර්ණය කිරීම...**

නියෝජ්‍ය පොලිස්පති කොට්ඨාශ සීමා නිර්ණය සම්බන්ධයෙන් පොලිස් කොට්ඨාශ මායිම් සමඟ පරිපාලන දිස්ත්‍රික් මායිම් හා පළාත් මායිම් සමපාත නොවන අවස්ථා හඳුනා ගැනීම, එම සීමා නිර්ණ ගැටළු සඳහා විසඳුම් යෝජනා කිරීම එම කරුණු හා ප්‍රායෝගික තත්වයන් කෙරෙහි අවධාරණය කරමින් අවසන් වාර්තාවක් සකස් කර ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇති අතර, මේ වන විට එම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය හිමි වී ඇති බැවින් එම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර ඒ අනුව සීමා නිර්ණ යෝජනා පළාත් මට්ටමින් ක්‍රියාත්මක කරමින් පවතී.

- **ස්ථානීය ක්ෂණික දඩ මුදල් අය කිරීමේ සහ රියදුරු අකුසලතා ලකුණු කිරීමේ ව්‍යාපෘතිය...**

රියදුරු මාර්ග විනය ඇති කිරීම උදෙසා රියදුරු අවාසි සහගත ලකුණු ක්‍රමය සහ රථවාහන මාර්ග නීති උල්ලංඝනය වූ අවස්ථාවලදී උසාවියට ඉදිරිපත් නොකරන වැරදි ක්ෂණික දඩ මුදල් එකතු කිරීමේ පුළුල් ඒකාබද්ධ ඉලෙක්ට්‍රොනික විසඳුමක් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය, මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහ අදාල සියලුම ආයතන ඒකාබද්ධව අදියර 03 ක් යටතේ රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/23/0472/626/004-I හා 2023.04.18 දිනැතිව ලබා දී ඇත. ඒ අනුව අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සුදුසු ආයතනයක් තෝරා ගැනීමේ කටයුතු ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය හා එක්ව සිදු කරමින් පවතී. එතෙක් මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන පොදු 172 මුදල් භාර ගැනීමේ කුවිතාන්සිය වෙනුවට එම දෙපාර්තමේන්තුව විසින් ලබා දීමට නියමිත E-Counter 01 ආකෘති පත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන එම ආකෘතිය ප්‍රකාරව මුදල් ගෙවීම පිළිබඳ රිසිවිපත නිකුත් කිරීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

- **මත්ද්‍රව්‍ය විනාශ කිරීම සම්බන්ධව Incinerator යන්ත්‍රයක් ස්ථාපිත කිරීම...**

අත්අඩංගුවට ගෙන විනාශ කිරීමට අධිකරණ නියෝග ලැබී ඇති මත්ද්‍රව්‍ය ජාතික වශයෙන් තර්ජනයක් බැවින් විනාශ කිරීම සඳහා ක්‍රියාත්මක වීමේ වැදගත් පියවරක් සේ සළකා අමාත්‍යාංශය ඒ සඳහා මැදිහත්ව කටයුතු කරනු ලබයි. මෙහිදී මේ සඳහා යොදා ගනු ලබන යන්ත්‍රය (Incinerator) ස්ථාපිත කිරීමට වනාතවිල්ලුව ලැක්ටොවත්ත ඉඩම තෝරා ගෙන ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා නාවික හමුදාව, විශේෂ කාර්ය බලකාය යන ආයතන සම්බන්ධ කර ගනිමින් මෙම මත්ද්‍රව්‍ය අපහරණය සිදු කිරීමට අදාළ ගොඩනැගිල්ල ඉදිකර (Incinerator) යන්ත්‍රය ස්ථාපිත කර ඇත. 2024.05.09 දින පළමු පූර්ණ දහන පරීක්ෂණය සිදු කරන ලදි. ඉන් අනතුරුව සමාන්‍ය පරිදි අත්අඩංගුවට ගනු ලබන මත්ද්‍රව්‍ය දහනය කිරීමේ කටයුතු සිදු කෙරේ.

- **රාජකාරි කටයුතු සිදු කරමින් සිටියදී මියගිය පොලිස් නිලධාරින්ගේ යැපෙන්නන්ට හා ආබාධිත විශ්‍රාමිකයන්ට සහන සලසමින්...**

නීතිය හා සාමය ආරක්ෂා කිරීම පෙරදැරිව ඉටු කල රාජකාරි අතර තුර මරණයට හෝ ආබාධිත තත්ත්වයට පත් වූ ශ්‍රී ලංකා පොලිස් හා විශේෂ කාර්ය බලකා නිලධාරින් සඳහා විශේෂ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ලබා ගෙන ඇති අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කරමින් නිලධාරින් 35 දෙනෙකු සඳහා 2024 වර්ෂයේදී වන්දි ලබා දීමට ක්‍රියා කර ඇත.

2.1. මහජන දුක්ගැනවිලි කඩිනමින් සමනය කිරීම පිණිස...

- **අමාත්‍යාංශයේ මහජන පැමිණිලි විසඳීම...**


අමාත්‍යාංශ සම්බන්ධීකරණ කොට්ඨාසය යටතේ පවත්වාගෙන යනු ලබන මහජන පැමිණිලි අංශය මඟින් 118 ජාතික සේවා මැදිරිය වෙත සිදු කරන ලද පොලිස් නිලධාරීන්ගේ විෂමාචාර ක්‍රියා සම්බන්ධව, පොලිස් නිලධාරීන්ට විරුද්ධව මහජනයා විසින් කරනු ලබන පැමිණිලි හා පොලිස් ස්ථානය වෙත කර ඇති විභාග නොවූ පැමිණිලි සම්බන්ධව පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමන්ලා වෙත යොමු කර කඩිනම් විමර්ශණයන් සිදු කර ප්‍රගතිය ලබා ගැනීමට කටයුතු කරනු ලබයි.

තවද, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආගමන විගමන දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, අන්තරයාකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය යන ආයතනවලට විරුද්ධව යොමු කරන පැමිණිලිද ලබා ගෙන විමර්ශණය සඳහා අදාල අංශය වෙත යොමු කරනු ලබයි. ඒ යටතේ සමාලෝචිත කාලය තුළ පැමිණිලි 7731 ලැබී ඇති අතර ඒ සියල්ල සඳහා ක්‍රියාමාර්ග ගැනීමට හැකි වී ඇත.

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන ආයතන මඟින් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වූ හෝ ක්‍රියාත්මක නොවූ කරුණු සම්බන්ධයෙන් සහන ලබා ගැනීම, රාජ්‍ය ආයතන හා නිලධාරීන්ට විරුද්ධව පැමිණිලි හා චෝදනා යොමු කිරීම යනාදිය සඳහා මහජනතාවට අවස්ථාව ලබා දී ඇත. ඒ යටතේ 2024 වර්ෂයේදී පාතාල ක්‍රියාකාරකම් සම්බන්ධව, මත්ද්‍රව්‍ය ක්‍රියාකාරකම් සම්බන්ධව සමාජීය වශයෙන් බලපාන පැමිණිලි 55 ලැබී ඇත. එමෙන්ම පොලිස් විෂයට අදාලව ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය හා වෙනත් රාජ්‍ය ආයතන වෙතින් යොමු කරන ලද පැමිණිලි 920ක්ද, පොලිස් නිලධාරීන්ට හා රාජ්‍ය නිලධාරීන්ට විරුද්ධව මහජනතාව විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි 123 හා වෙනත් පැමිණිලි 38 වශයෙන් සමාලෝචිත කාලය තුළ ඉදිරිපත් කළ අභියාචනා හා දුක්ගැනවිලි 1136කින් 962 ක් සඳහා ක්‍රියා කර අවසන් කර ඇති අතර ක්‍රියාත්මක මට්ටමේ පවතින අභියාචනා සංඛ්‍යාව 142 කි. එසේම ඉදිරිපත් වී ඇති පැමිණිලි වලින් පැමිණිලි 32 ක් පොලිස් විෂය පථයට අයත් නොවන බැවින් අදාල වෙනත් ආයතන වෙත යොමු කර ඇත.

- **118 හදිසි ඇමතුම් සේවාව...**

118 ජාතික සේවා මැදිරියේ මූලික පරමාර්ථය වී ඇත්තේ රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් මහජනයා විසින් දන්නා තොරතුරු කඩිනමින් අමාත්‍යාංශය වෙත ලබා ගැනීමය. මීට අමතරව ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ හා අමාත්‍යාංශය යටතේ ඇති සියළුම රාජ්‍ය ආයතන වලට විරුද්ධව පැමිණෙන චෝදනා හා අදහස් යොමු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙසද ක්‍රියා කරයි. 118 ජාතික සේවා මැදිරිය 2023.10.13 දින සිට නව තාක්ෂණය හා මුසු වෙමින් පැය 24 පුරා ක්‍රියාත්මක Online Emergency & amp; Public Complain Management System එකක් වශයෙන් මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ අමාත්‍යාංශ පරිශ්‍රයේ ක්‍රියාත්මකව පවතී. එම සේවාව වෙත 2024 වර්ෂයට පැමිණිලි 105,825 ක් ලැබී ඇති අතර ඒ සියල්ල සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.



2.2. සංවර්ධන වැඩසටහන් අධීක්ෂණ කටයුතු සිදු කරමින්...

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සඳහා වාර්ෂික ප්‍රාග්ධන ප්‍රතිපාදනවලට අදාළ ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය කාර්තුමය ලෙස සමාලෝචනය කිරීමේ රැස්වීම් පවත්වන ලදි. විශේෂයෙන්ම ඉදිකිරීම් හා භාණ්ඩ මිලදී ගැනීම් ව්‍යාපෘතිවල ගැටලු ඇති වූ අවස්ථාවලදී අදාළ පාර්ශවයන් කැඳවා එම ගැටලු නිරාකරණයට අවශ්‍ය උපදෙස් හා ක්‍රියාමාර්ග ගනු ලැබිණි. එසේම කොන්ත්‍රාත්කරුවන්ගේ අකාර්යක්ෂමතාවය මත ව්‍යාපෘති ක්‍රියාත්මක වීම අඩාල වූ ව්‍යාපෘතිවල ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකා සිදු කර අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට විධිවිධානද සලස්වන ලදි.

- **අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන සැලසුම් ක්‍රියාවට නංවමින්....**

    - අභ්‍යන්තර විගණන අංශය මගින් අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල විගණන විමසුම්, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය ඇතුළු අනෙකුත් මූල්‍ය හා පරිපාලන කටයුතු අදාළ චක්‍රලේඛ හා නීති රීති අනුව ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය විගණන ක්‍රියාමාර්ග ගෙන ඇත. සකස් කල විගණන සැලැස්මට අනුව 2024 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇත. ඒ අනුව 2024 වර්ෂයට අදාළව සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මෙන් 75% ක් ආවරණය කිරීමට හැකි වී ඇත.

    - ආයතනික අභ්‍යන්තර ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අමාත්‍යාංශය තුළ අභ්‍යන්තර විගණන අංශය විසින් අත්තිකාරම් බී ගිණුම, පොදු තැම්පත් ගිණුම, වත්කම් කළමනාකරණය, ගබඩා පරීක්ෂාව, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ, භාණ්ඩ අපහරණ, බඩු තොග පාලනය, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, ව්‍යාපෘතිවල ප්‍රගතිය පරීක්ෂාව, පුද්ගලික ලිපි ගොනු නඩත්තුව, නිවාඩු සහ වාහන නඩත්තුව, අමාත්‍යාංශ වෙබ් අඩවිය යන ක්ෂේත්‍ර ඔස්සේ අදාළ කාලය තුළ විගණනයන් සිදුකර එක් එක් අංශ සඳහා විගණන විමසුම බැගින් නිකුත් කර ඇත.

    - එමෙන්ම සමාලෝචිත කාලය තුළ විශේෂ කාර්ය බලකායේ ගෙවීම් වවුචර් පරීක්ෂාවන් සිදු කර ඇත. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යටතේ මූලස්ථාන විගණන පරීක්ෂාවක් හා ගාල්ල පුනරුත්ථාපන මධ්‍යස්ථාන පරීක්ෂාවක්ද සිදු කර ඇත. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ලේකම් කාර්යාලයේ රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය පිළිබඳවත්, මූල්‍ය හා අනෙකුත් අංශවල සිදුවන අක්‍රමිකතා පරීක්ෂා කිරීමටත්, වාර්ෂික සැලසුම්, ප්‍රගති සමාලෝචනය, ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්බන්ධ එක් විගණන විමසුමක්ද යොමු කිරීමට ක්‍රියාකර ඇත. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට අදාළව විදෘශූත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් එක් විගණන විමසුමක්ද යොමු කර ඇත.

2.3. අන්තර් සහයෝගීතාවය ලබා ගනිමින්...

වර්තමාන මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු ගරු අමාත්‍යතුමා එම ධූරය භාරගැනීමෙන් පසු ප්‍රථමයෙන්ම ඒ හා බැඳුණු භාරධූර වගකීම හා කාර්යය භාර්යය ඉටු කිරීම සඳහා විවිධ පාර්ශවයන්ගේ සහයෝගය ලබා ගැනීම වෙනුවෙන් සාකච්ඡා පවත්වන ලදි. ඒ අතර විදේශ නියෝජිතයින් හා අන්තර් සම්බන්ධීකරණයන් අවශ්‍ය අමාත්‍යාංශවල අමාත්‍යවරුන් සමඟ ද සාකච්ඡා පවත්වන ලදි.

- **ද්විපාර්ශවීය ගිවිසුම් විදේශීය රාජ්‍යයන් සමඟ...**

ශ්‍රී ලංකා රජය හා විදේශ රාජ්‍යයන් අතර නීතිය බලාත්මක කිරීම, පුහුණු පාඨමාලා, තොරතුරු පහසුකම් හා හුවමාරු කර ගැනීමට හා තාක්ෂණික මෙවලම් හා උපදෙස් ලබා ගැනීම, විදේශ රටවල නීත්‍යානුකූල නොවන අයුරින් රැඳී සිටින පුරවැසියන් ශ්‍රී ලංකාවට නැවත ගෙන්වා ගැනීම ආදී වූ ක්‍රියාවලීන් සඳහා මෙම අමාත්‍යාංශය මඟින් අවබෝධතා ගිවිසුම් ඇති කරගනු ලැබේ. එම ගිවිසුම් අතර රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර සහිත නිලධාරීන්ට රටවල් රැසකට වීසා රහිතව ගමන් කිරීමේ පහසුකම් ද සළසා ඇත. ඒ අනුව රුවන්ඩා ජනරජය , ලාඕසය, ආදී රටවල් සමඟ ද්වි පාර්ශවික ගිවිසුම්වලට මෙම වර්ෂය තුළදී එළඹී ඇත.

- **මිනිස් ජාවාරම් සම්බන්ධ...**

මානව ජාවාරම තුරන් කිරීමේ දේශීය කාර්යසාධක බලකායේ ප්‍රධානම පාර්ශවකරුවකු වශයෙන් මෙම අමාත්‍යාංශය ක්‍රියාත්මක අතර ශ්‍රී ලංකා පොලිසිය HTMCID මානව ජාවාරම් සමුදීය අපරාධ විමර්ෂන අංශය සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙමින් මානව ජාවාරම පිටු දැකීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම ළමා ජාවාරම පිටුදැකීම සඳහා සම්මත මෙහෙයුම් පටිපාටියක් එළි දක්වා ඇත.

2.4. අමාත්‍යාංශයේ මධ්‍යකාලීන ඉලක්ක

- පොලිස් නිලධාරින්ගේ උසස්වීම්, ස්ථානමාරුවීම් සහ විනය සම්බන්ධ ගැටලු සඳහා විසඳුම් ලබාදීම කාර්යක්ෂම කිරීම හා අවශ්‍ය මානව සම්පත ලබාදීම.

- රිය අනතුරු අවම කරලීම සඳහා ශ්‍රී ලංකා පොලිසියේ රථවාහන කොට්ඨාසය නව තාක්ෂණයෙන් ශක්තිමත් කිරීමට පියවරගැනීම.

- අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව විදේශ ගමන් බලපත්‍ර සකස් කිරීම, වීසා හා පුරවැසිභාවය නිකුත් කිරීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සවිබලගැන්වීම.

- මත්ද්‍රව්‍ය උවදුර සහ අන්තරායකර ඖෂධ දුර්භාවිතය මැඩලීමට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සවිබලගැන්වීම.

- රාජ්‍ය නොවන සංවිධන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය ශක්තිමත් ආයතනයක් බවට පත්කර ඒ තුලින් ජාතික ආර්ථික සංවර්ධනයට ඉහළ දායකත්වයක් ලබාගැනීම.

03. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

						එසිඒ-එෆ්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා						
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය						
				තක්‍ය		
සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන		2024	2023	
රු.				රු.	රු.	
-	**ආදායම් ලැබීම්**			-	-	
-	ආදායම් බදු		1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු		2	-	-	එසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු		3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්		4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**			-	-	
-	**ආදායම් නොවන ලැබීම්**			-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම			13,692,548,000	10,977,399,872	එසිඒ-3
-	තැන්පතු			66,289,329	56,511,419	එසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්			73,359,626	72,716,717	එසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**			**13,832,196,955**	11,106,628,009	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**			**13,832,196,955**	11,106,628,009	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)			-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)			13,832,196,955	11,106,628,009	
	අඩු කළා : වියදම්					
-	**පුනරාවර්තන වියදම්**			-	-	
10,860,013,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ		5	10,841,366,258	7,909,323,551	
2,473,970,000	අනෙකුත් භාණ්ඩ හා සේවා		6	2,449,010,299	3,018,026,135	එසිඒ-2(ii)
504,979,560	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්		7	477,500,170	362,052,781	
-	පොළී ගෙවීම්		8	-	-	
18,440	වෙනත් පුනරාවර්තන වියදම්		9	18,440	-	
13,838,981,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**			**13,767,895,167**	11,289,402,467	
	මූලධන වියදම්					
307,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්		10	289,569,977	137,531,989	
227,464,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්		11	226,373,134	237,371,259	
193,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්		12	164,094,797	18,689,703	එසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම		13	-	-	
5,800,000	හැකියා වර්ධනය		14	4,733,968	4,852,682	
3,300,000,000	වෙනත් මූලධන වියදම්		15	1,148,260,476	624,000,640	
4,033,764,000	**මුළු මූලධන වියදම් (උ)**			**1,833,032,353**	1,022,446,273	
	තැන්පතු ගෙවීම්			89,810,225	51,651,702	එසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්			87,219,923	65,192,860	එසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්			-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)			177,030,148	116,844,562	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)			15,777,957,668	12,428,693,302	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**			(1,945,760,713)	(1,322,065,293)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය			(1,946,125,690)	(1,322,065,293)	එසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය			364,977		එසිඒ-3
				(1,945,760,713)	(1,322,065,293)	

3.1. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2024.12.31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

එස්සීඒ-පි

	සටහන	තත්‍ය	
		2024	**2023**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	එස්සීඒ-6	9,727,552,943	8,646,567,158
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	එස්සීඒ-5/5(ඒ)	49,121,933	35,261,636
මුදල් හා මුදල් සමාන දෑ	එස්සීඒ-3	-	
මුළු වත්කම්		**9,776,674,877**	**8,681,828,794**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		24,701,051	(12,315,165)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		9,727,552,943	8,646,567,158
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	එස්සීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	එස්සීඒ-4	24,055,905	47,576,801
අග්‍රිම ශේෂය	එස්සීඒ-3	364,977	-
මුළු වගකීම්		**9,776,674,877**	**8,681,828,795**

3.2. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය


	තත්‍ය	
	2024 රු.	නැවත ගලපන ලද **2023** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	991,807,572	601,189,160
අග්‍රිම ලැබීම්	13,692,548,000	10,977,399,872
අත්තිකාරම් අයකර ගැනීම්	82,328,789	68,885,206
තැන්පතු ලැබීම්	66,289,329	56,511,419
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**14,832,973,690**	**11,703,985,657**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	13,111,882,978	10,715,286,511
සහනාධාර සහ මාරුකිරීම්	89,376,874	68,400,615
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	859,582,774	253,412,071
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	87,889,469	65,243,977
තැන්පතු ගෙවීම්	89,810,225	51,651,703
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**14,238,542,319**	**11,153,994,876**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**594,431,370**	**549,990,781**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	594,066,394	549,990,781
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	594,066,394	549,990,781
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(549,990,781)**	(549,990,781)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(364,977)**	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**364,977**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**364,977**	**-**

3.3. මුල්‍ය ප්‍රකාශ සටහන

පිටු අංක 12 සිට 15 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 16 සිට 17 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.



3.4. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් වර්ගය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසන් ආදාම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාල නොවේ					

රු.'000

3.5. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.'000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන - 2024		තත්‍ය වියදම 2024.12.31	උපයෝගි කර ගනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	13,145,500,000	13,838,981,000	13,767,895,167	93%
ප්‍රාග්ධන	3,837,000,000	4,033,764,000	1,833,032,353	62%

3.6. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.'000

වත්කම් කේතය	කේත විස්තරය	2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	-	1,977,693.00		
9152	යන්ත්‍රෝපකරණ	-	3,898,688.00		
9153	ඉඩම්	-	1,977,693.00		
9154	අස්පෘශ්‍ය වත්කම්	-	939.00		
9160	කෙරීගෙන යන වැඩ	-	792,242.00		

04. පරිච්ඡේදය - කාර්ය සාධක දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධක දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
අපරාධ විසඳීමේ ප්‍රතිශතය		✓	
විශේෂ කාර්ය බලකාය දායක්වය සැපයූ වැටලීම් ගණන	✓		
ක්‍රියාකාරී මහජන ආරක්ෂක කමිටු හා ක්‍රියාත්මක කළ දැනුවත් කිරීම් වැඩසටහන් ගණන			✓
එක්දින සේවය යටතේ දිනක් තුළ ගමන් බලපත්‍ර සකස් කිරීමට ලැබුනු අයදුම්පත් සංඛ්‍යාවට අනුව දිනක් තුළ නිකුත් කල ගමන් බලපත්‍ර සංඛ්‍යාවේ ප්‍රතිශතය	✓		

05. පරිච්ඡේදය

5.1. තිරසර සංවර්ධන අරමුණු

2030 වර්ෂය වන විට රාජකාරී මඟින් සපුරා ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක							
තිරසර සංවර්ධන අරමුණු	අදාළ වන තිරසර සංවර්ධන ඉලක්කය	තිරසර සංවර්ධන දර්ශකය	2030 වසර වන විට අපේක්ෂිත ඉලක්කය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය			වෙනත්
				0%-49%	50% - 74%	75% - 00%	
03. නිරෝගි ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම	3.6.2030 වන විට මහාමාර්ගවල සිදු වන අනතුරු හේතුවෙන් සිදු වන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව	3.6.1. පසුගිය මාස 12ක කාල සීමාව තුළ මාර්ග අනතුරු හේතුවෙන් සිදු වන මරණ සංඛ්‍යාව (අනුපාතය)	2030 වර්ෂය වන විට පාදක වර්ෂයෙන් (2015) 20% ක් අඩු කිරීම" (10.74 ජනගහනය 100000 සඳහා) (13.43-10.744)13.43			√	
08. සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	8.7. බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කුට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුළත් ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ	.7.1 අවුරුදු 5-17 අතර ළමා ශ්‍රමිකයින් ලෙස යොදා ගෙන ඇති සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ සහ වයස අනුව	(ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන සමීක්ෂණ මඟින් ලබා ගත් දත්ත මත කම්කරු දෙපාර්තමේන්තුව මඟින් නිර්ණය කළ යුතු ව ඇත. මේ වන විට තිරසර සංවර්ධන සභාව ලබා දී ඇති අගය 0 වේ)				තවද මෙම ඉලක්කයට අදාළව පරිපාලන දත්ත (අපරාධ වෝදනා මත නඩු පැවරූ සිදුවීම් සංඛ්‍යාව) පමණක් ලබා දීමේ හැකියාවක් පවතී.

	තුරන් කිරීම සහ 2025 වන විට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම.						
11. නගර සහ මිනිස් ජනාවාස ඇතුළත් ආරක්ෂිත ඔරෝත්තු දෙන සහ තිරසර කිරීම	.11.7 2030වන විට විශේෂයෙන්ම කාන්තාවන්ට සහ ළමුන්ට, වයස්ගත පුද්ගලයින්ට සහ ආබාධ සහිත පුද්ගලයින්ට ආරක්ෂාකාරී වන, සියලු දෙනාට ම එක්ව සලකන සහ පහසුවෙන් පිවිසිය හැකි පොදු හරිත අවකාශයන් ලබා දීම	11.7.2. පෙර මාස 12 තුළ ලිංගිකත්වය, වයස, ආබාධිත තත්වය සහ සිදු වූ ස්ථානය අනුව ශාරීරික හෝ ලිංගික හිරිහැර වලට ගොදුරු වූවන්ගේ අනුපාතය	මේ පිළිබඳ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන සමීක්ෂණයකින් ඇගයීමෙන් අනතුරුව වර්තමාන ස්වභාව හඳුනා ගැනීමෙන් අනතුරුව මෙහි ඉලක්ක නිර්ණය කළ හැක.				ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමක ම ඵලදායී, වග වීම් සහිත පරිපූරණ ආයතන ගොඩනැගීම	16.1 සියලු ම ස්ථානයෙන් හි සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයෙන් සහ ඒ ආශ්‍රිත මරණ කැපී පෙනෙන ලෙස අඩු කිරීම.	16.1.1. පසුගිය මාස 12ක කාල සීමාව තුළ වාර්තා වී ඇති රටේ ජනගහනයෙන් පුද්ගලයන් 100000කට චේතනාන්විත මනුෂ්‍ය ඝාතන සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ භාවය හා වයස අනු	2030 වර්ෂය වන විට පාදක වර්ෂයෙන් (2015) 33%කින් අඩු කිරීම 100000 කය 1.5 දක්වා අඩු කිරීම	✓			
		16.1.2 ජනගහනයෙන් පුද්ගලයන් 100000කට වාර්තා වී ඇති ගැටුම් හා සම්බන්ධ හේතු නිසා සිදු වන මරණ සංඛ්‍යාව, (ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ හේතුව අනුව	2030 වර්ෂය වන විට මරණ සංඛ්‍යාව 0 බවට පත් කිරීම (100%ක්)			✓	
		16.1.3 පසුගිය මාස 12ක කාල සීමාව තුළ වාර්තා වී ඇති කායික, මානසික හෝ ලිංගික හිංසනයට ගොදුරු වූ චින්දිතයන්ගේ සංඛ්‍යාව, ශ්‍රී ලංකාවේ ජනගහනයට අනුපාතය	2030 වර්ෂය වන විට පාදක වර්ෂයෙන් (2015) 45% කින් අඩු කිරීම ජනගහන 100,000 18කි.32.6 -18/32.6	✓			
		16.1.4 අදුර වැටීමෙන් පසුව තමන් ජීවත් වන ප්‍රදේශයේ වටා තනිව ම ඇවිදීම ආරක්ෂිත යැයි හැඟෙන සංඛ්‍යාව, ශ්‍රී ලංකාවේ	මේ පිළිබඳ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන සමීක්ෂණයකින් ඇගයීමෙන් අනතුරුව				ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

		ජනගහනයට අනුපාතය	වර්තමාන ස්වභාව හඳුනා ගැනීමෙන් අනතුරුව මෙහි ඉලක්කය නිර්ණය කළ හැක.				
	16.2 ළමුන් කෲර වධහිංසා කිරීම්වලට සහ අපයෝජනයට, සූරාකෑමට, කුට්ටනයට සහ සියලු ම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ට ලක් වීම අවසන් කිරීම	16.2.1 පසුගිය මාස 12ක කාල සීමාව තුළ වාර්තා වී ඇති හාරකරුවන්/රැකවලුන්/මෙහෙකරුවන් අතින් කායික දඬුවම් හෝ මානසික ප්‍රචණ්ඩත්වය අත්විඳීමට සිදු වූ වයස අවු 1-17 දක්වා වන ළමුන්ගේ සංඛ්‍යාව (ආසන්න දර්ශකය : ළමුන්ට එරෙහිව සිදු කරන අපරාධ සංඛ්‍යාව(	2030 වර්ෂය වන විට පදනම් වර්ෂයෙන්(2015) 25% අඩු කිරීම 3932-2900/3932 ආසන්න දර්ශකයකි. ලංකා ශ්‍රී) පොලිසිය මඟින් පරිපාලන දත්ත (ලබා දේ	√			
		16.2.2 පසුගිය මාස 12ක කාල සීමාව තුළ වාර්තා වී ඇති ජනගහනයේ පුද්ගලයන් 100000ක් අතරින් මිනිස් ජාවාරමෙහි ගොදුරු බවට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ භාවය හා වයස සහ අපයෝජනයේ ස්වරූපය අනුව	2030වර්ෂය වන විට මිනිස් ජාවාරම්වලට ගොදුරු වන්නන් සංඛ්‍යාව 0 කිරීම (%100)	√			
		16.2.3 පසුගිය මාස 12ක කාල සීමාව තුළ වාර්තා වී ඇති වයස අවු 18 වන විට ලිංගික හිංසනය අත්විඳ ඇති වයස අවු 18-29 වයස් කාණ්ඩයේ තරුණ කාන්තාවන් සහ පිරිමින්ගේ සංඛ්‍යාව)ජනගහනයට අනුපාතය(	මේ පිළිබඳ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් සමීක්ෂණයක් සිදු කිරීමෙන් මෙහි වර්තමාන තත්වය ඇගයීමකට ලක් කර අනතුරුව ඉලක්ක අගය නිර්ණය කළ හැකි ය.				ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
	16.3 සියලු ම දෙනාට නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකි වීම සහ ජාතික සහ අන්තර්ජාතික මට්ටම්වල් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම	16.3.3 ශ්‍රී ලංකා පොලිසියට වාර්තා වන පැමිණිලි සංඛ්‍යාව (ආසන්න දිර්ශකයකි)	ශ්‍රී ලංකා පොලිසිය මඟින් පරිපාලන දත්ත ලබා දීම පමණක් සිදු කරන අතර මෙම දර්ශකයෙහි අගය අධිකරණ අමාත්‍යාංශය ලබා දේ.				වගකීම අදිකරණ අමාත්‍යාංශය සතු වන අතර පරිපාලන දත්ත ශ්‍රී ලංකා පොලිසිය මඟින් ලබා දේ. එම අගය පුද්ගලයින් 100,000කට පැමිණිලි 4,194කි.

	16.4 2030 වන විට නීති විරෝධී මූල්‍ය සහ ආයුධ ප්‍රවාහයන් කැපී පෙනෙන ලෙස අඩු කිරීම, සොරකම් කරන ලද වත්කම් නැවත ලබා ගැනීම ශක්තිමත් කිරීම සහ සියලුම ආකාරයේ සංවිධානාත්මක අපරාධ තුරන් කිරීම	16.4.1 අභ්‍යන්තර සහ බාහිර නීති විරෝධී මූල්‍ය ප්‍රවාහවල මුළු වටිනාකම) වත්මන් එක්සත් ජනපද ඩොලර් වලින්(	ශ්‍රී ලංකා පොලිසියෙන් මෙතෙක් දත්ත ලබා දී නොමැති අතර මෙම දර්ශකය සඳහා ඉලක්ක අගයන් ලබා දීම සම්බන්ධයෙන් මහ බැංකුව හා ආදායම් බදු දෙපාර්තමේන්තුව එක්ව සිදු කළ යුතු කළ යුතු ව ඇත				මහ බැංකුව හා ආදායම් බදු දෙපාර්තමේන්තුව අගයන් සකස් කිරීම ප්‍රායෝගික නොවේ.
		16.4.2 පසුගිය මාස 12ක කාලය තුළ වාර්තා වී ඇති ජාත්‍යන්තර ප්‍රමිතිය / ක්‍රියාදාමයට අනුකූලව නිසි බලධාරියෙකු විසින් නීති විරෝධී සම්භවය හෝ පසුබිම සොයා ගැනීම හෝ ස්ථාපිත කර ඇති අත් අඩංගුවට ගත්, සොයා ගත් හෝ භාර දුන් ආයුධවලට අදාළ සිද්ධි සංඛ්‍යාව හා එයට අදාළ ආයුධ සංඛ්‍යාව	2030සඳහා අපේක්ෂිත අගයන් සකස් කර නොමැත තත්කාලයේ දිවයින තුළ තිබෙන නීති විරෝධී අවි පිළිබඳ ප්‍රායෝගිකව දැන ගැනීමට නොහැක				(තත්කාලයේ දිවයින තුළ තිබෙන නීති විරෝධී අවි පිළිබඳ ප්‍රායෝගිකව දැන ගැනීමට රෙනාහැකිය)
	16.10 ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තිත්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම තහවුරු කිරීම	16.10.1 පසුගිය මාස 12 තුළ වාර්තා වී ඇති මාධ්‍යවේදීන්, මාධ්‍යවේදී ආශ්‍රිතයන්, වෘත්තීය සමිති සාමාජිකයින් සහ මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින්නන් ඝාතනය කිරීම, පැහැර ගෙන යාම, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම, අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම සහ වධහිංසා පැමිණ වීම් පිළිබඳ සත්‍යාපිත සිද්ධීන් සංඛ්‍යාව	2030වර්ෂය වන විට 0 දක්වා අඩු කර ගැනීම (%100)			√	
		.16.10.1a. ලිංගිකත්වය වයස් කාණ්ඩය අනුව අපයෝජනය වන ආකාරය හෝ අපයෝජන අපරාධකරුවන්ගේ ස්වභාවය	ළමාරක්ෂක අධිකාරිය මඟින් ප්‍රධාන වශයෙන් දත්ත ලබා දීම සිදු වේ ඇත. මේ සඳහා ඉලක්ක අගය ළමාරක්ෂක අධිකාරිය නිර්ණය කල යුතුව ඇත.				ළමාරක්ෂක අධිකාරිය

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකවින් විස්තර කරන්න.

1) මාර්ග අනතුරු වලින් සිදුවන මරණ සංඛ්‍යාව අඩුකිරීම මෙම අමාත්‍යාංශයට අදාළවන තිරසර සංවර්ධන ඉලක්කයකි. ශ්‍රී ලංකාවේ මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන මරණ අනුපාතය පසුගිය වසර කීපය හා සැසඳීමේදී සමානුපාත මට්ටමක පවතින බව දැක ගත හැකිය. මාර්ග අනතුරු වලින් සිදු වන ජීවිත හානි අඩු කිරීමට ක්‍රියා මාර්ග ගැනීමේදී පාලනය කිරීමට අපහසු ප්‍රධාන සාධක ලෙස හඳුනා ගත හැක්කේ වාහන ප්‍රමාණයට ප්‍රමාණවත් වන ලෙස මාර්ග පද්ධතිය ගුණාත්මකව පුළුල් නොවීම හා රියදුරන් විනයගරුක ලෙස කටයුතු නොකිරීමය. මෙම හේතු සාධක සඳහා පිළියම් යෙදීමට අදාල සියළු පාර්ශව සමඟ ඒකාබද්ධ ප්‍රවේශයකින් වැඩසටහන් ක්‍රියාත්මක කල යුතු වන අතර එය අභියෝගයක් ලෙස හැඳින්විය හැකිය.

2) සමාජය තුළ ජීවත් වන පුද්ගලයින්ගේ සිතුම් පැතුම් ඉටු කර ගැනීමට නොහැකි අයහපත් සමාජ, ආර්ථික හා සංස්කෘතික තත්වයක් ගොඩනැගී පැවතීම, සියදිවි නසාගැනීම් සිදුවීමට බලපාන ප්‍රධාන සාධකය වේ. සියදිවි නසා ගැනීම් අඩු කරලීම සඳහා සමස්ථ රාජ්‍ය යාන්ත්‍රණය එම අයහපත් තත්වයන් සමනය කිරීමට ඒකාබද්ධව කටයුතු කළයුතු වේ. එය අභියෝගයක් ලෙස හැඳින්විය හැකිය.

3) අමාත්‍යාංශය යටතේ හඳුනාගෙන ඇති තිරසර සංවර්ධන දර්ශක වල අගයන් 2030 වන විට යහපත් තත්ත්වයකට පත්වීමට උපරිමයෙන් ක්‍රියාමාර්ග ගනිමින් සිටී. අපේක්ෂිත අගයන් වලට ලඟා වීමට පවත්නා නීති සංශෝධනය කිරීමටත්, නව නීති සම්පාදනය කිරීම හා ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන ආයතන වල සහය ලබා ගනිමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටී. අපරාධ සිදුවීමට පාදක වන පසුබිම වෙනස් කිරීමට අදාළව ක්‍රියා මාර්ග ගැනීමට සියළු ආයතන එක් විය යුතු අතර එක් ආයතනයකට පමණක් එය කළ නොහැකිය.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	22	17	05
තෘතියික	06	01	05
ද්විතීයික	70	58	12
ප්‍රාථමික	34	30	04
තාවකාලික	05	03	02

තෘතියික මට්ටමේ තනතුරු වන සිංහල දෙමළ භාෂා පර්වර්තක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී, සංඛ්‍යාලේඛන නිලධාරී යන තනතුරු සඳහා නිලධාරීන් මෙතෙක් බඳවා ගැනීමට හෝ අනුයුක්ත කර ගැනීමට නොහැකි වීම මත අමාත්‍යාංශයේ ඇතැම් රාජකාරි කටයුතු සිදු කිරීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවී ඇත.

- ආයතනික කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන්නේ කෙසේදැයි කෙටියෙන්.

  ආයතනික විෂය පථය විශ්ලේෂණයට ලක්කර 2024 වර්ෂයේ අනුමත කර ගත් සේවක සංඛ්‍යාවෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ (මාණ්ඩලික නිලධාරීන්ගේ) ඇබෑර්තු ප්‍රමාණය සම්පූර්ණ කිරීමට නොහැකි වීම තුළ ආයතනයේ අධික්ෂණය කරනු ලබන රාජකාරී සඳහා සෘජුව බලපෑම් කරයි. සෙසු මට්ටම්වල නිලධාරීන්ගේ හිඟය දෛනික ආයතනික කටයුතුවල කාර්යසාධනය කෙරෙහි බලපෑමක් ඇති කරනු ලබයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. JLO/H/MPS/SR/2024/02 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2025 ජූනි 13 දින

ලේකම්

මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

ශීර්ෂය 189 - මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 189 - මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

මහජන ආරක්ෂක අමාත්‍යාංශය 16 JUN 2025 ලැබුණු දිනය සැලසුම් අංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මහජන ආරක්ෂක අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මූල්‍ය නොවන වත්කම් අත්පත්කර ගැනීම සඳහා රු.226,373,135ක් වැයකර තිබුණ ද, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි (SA-82) එම වටිනාකම රු.173,856,707ක් ලෙස රු.52,516,428ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2023 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි හා ඉදිකිරීම්, කෙරීගෙන යන වැඩශේෂය රු.732,237,046ක් වුව ද, 2024 ජනවාරි 01 දිනට එය රු.762,739,186ක් ලෙස දැක්වීම හේතුවෙන් SA - 82හි ආරම්භක ශේෂය රු.30,502,140ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2023 දෙසැම්බර් 31 දිනට අනෙකුත් යන්ත්‍ර සහ උපකරණ ශේෂය රු.2,888,360,739ක් වුව ද, 2024 ජනවාරි 01 දිනට එය රු.2,802,095,873ක් ලෙස දැක්වීම හේතුවෙන් SA – 82හි ආරම්භක ශේෂය රු.86,264,866 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රවාහන උපකරණ රු.852,430,841ක් වුව ද, 2024 ජනවාරි 01 දිනට එය රු.715,330,840ක් ලෙස දැක්වීම හේතුවෙන් SA – 82හි ආරම්භක ශේෂය රු. 137,100,001ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ මහජන ආරක්ෂක අමාත්‍යාංශයට අයත් වාහන 09ක් අනතුරට ලක්වී ඇති අතර, ඒ සම්බන්ධයෙන් තොරතුරු මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් i හා ii තුළ ඉදිරිපත්කර නොතිබුණි.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
මෝටර් වාහන ලැයිස්තුව	මූ.රෙ. 1647(ඉ)	පවත්වා නොතිබුණි.
ලොග් සටහන් පොත්	මූ.රෙ. 1645	යාවත්කාලීනකර නොතිබුණි.
හානි පිළිබඳ ලේඛනය (අත්තිකාරම් ගිණුම්වල හානි සහ වෙනත් කටයුතුවලදී සිදුවන හානි)	මූ.රෙ. 110	යාවත්කාලීනකර නොතිබුණි.
බැරකම් පිළිබඳ ලේඛනය	මූ.රෙ.214	පවත්වා නොතිබුණි

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මකකර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (ආ)	අමාත්‍යාංශයට අයත් වාහන 4ක් අවස්ථා පහකදී අනතුරට ලක්වී ඇති අතර, ඒ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි ඇමුණුම I හා ඇමණුම II තුළ ඉදිරිපත්කර නොතිබුණි.	1.6.1(ඉ)
1.6.5(අ)	ගොඩනැගිලි හා ඉදිකිරීම්, කෙරිගෙන යන වැඩ පෙර වර්ෂ අවසාන ශේෂය ඊළඟ වර්ෂයේ ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වශයෙන් ගැනීමට කටයුතු කළ යුතු වීම.	1.6.1 (ආ)
1.6.5 (ආ)	අනෙකුත් යන්ත්‍ර සහ උපකරණ පෙර වර්ෂ අවසාන ශේෂය ඊළඟ වර්ෂයේ	1.6.1 (ඇ)

	ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වශයෙන් ගැනීමට කටයුතු කළ යුතු වීම.	
1.6.5 (ඇ)	වැය ලෙජර අනුව සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් අත්පත්කර ගැනීම සඳහා රු.237,371,259ක් වැයකර තිබුණ ද, මූල්‍ය වත්කම් ප්‍රකාශයෙහි (ACA-6) මිලදීගැනීම් ලෙස රු.77,732,482ක් දක්වා තිබීම හේතුවෙන්, වර්ෂය තුළදී මිලදීගැනීම් රු.59,639,777ක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි අඩුවෙන් දක්වා තිබුණි.	1.6.1 (අ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) වැයවිෂයය අංක 189-1-01-1202-009 (ඉන්ධන වෙනත්) හා 189-1-01-1203-002 (නිලඇඳුම්) දරන වැයවිෂයයන් සඳහා රු.100,000ක් බැගින් වෙන්කරන ලද රු.200,000ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිකර තිබුණු අතර, ඊට හේතු වශයෙන් පිළිවෙලින්, වෙනත් අවශ්‍යතා සඳහා ඉන්ධන භාවිතා කිරීම වෙනුවෙන් බිල්පත් ඉදිරිපත් නොවීම හා රජයේ නිලධාරීන් අමාත්‍ය කාර්යමණ්ඩලයට පත්නොවීම මත ප්‍රතිපාදන ඉතිරිවීම් යන්න හේතු ලෙස දක්වා තිබුණි.

(ආ) ඇස්තමේන්තු සකස්කිරීමේ දුර්වලතාවය හේතුවෙන් වැය විෂයයන් 21ක් සඳහා මූලික ඇස්තමේන්තුව සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අතර විචලතාවය මූලික ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 50 සිට සියයට 2600ක් දක්වා පරාසයක් තුළ පැවතුණි.

(ඇ) වැය විෂයයන් 16ක් සඳහා සලසා තිබූ එකතුව රු.3,315,898,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදිතයෙන් රු.2,160,749,118ක් ඉතිරි වී තිබුණු අතර, එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 36 සිට සියයට 90 දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ඇ) වැයවිෂයයන් 7ක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකරන ලද රු.125,900,000ක ප්‍රතිපාදිතයෙන් රු.39,729,790ක් ඉතිරි වී තිබුණු අතර, එම ඉතිරිය මුදල් රෙගුලාසි 66 මාරු කිරීම්වලට ප්‍රතිශතයක් ලෙස සියයට 13 සිට සියයට 150ක පරාසයක් ගෙන තිබුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) මු.රෙ.447 (i) ප්‍රකාරව විසර්ජන වැයලෙජරයක් පවත්වාගත යුතු අතර, ඉකිරිව ඇති නිවැරදි මුදල් ප්‍රමාණය ගැනීමට හැකිවන ලෙස ගිණුමේ වියදම් කළ මුදල් ප්‍රමාණය පමණක් නොව බැඳී ඇති බැරකම් ද දැක්විය යුතු වුව ද, අමාත්‍යාංශ විසින් පිළියෙල කරන ලද, පොදු 138 අනුව වැයලෙජරයන්හී බැඳී තිබූ සියලු බැරකම් දක්වා නොතිබුණි.

(ආ) 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ 3.3 ඡේදය හා මු.රෙ. 94(2) සහ 94(3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් හා බැරකම් වෙන වෙනම හෙළිදරව් කළ යුතු වුවත්, වැය විෂයයන් 11කට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට එළඹී තිබුණු බැඳීම් සහ බැරකම් රු.2,827,638ක් බැරකම් හා බැඳීම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(ඇ) මු.රෙ.94(1) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් ඉක්මවා වියදමකට හෝ බැඳීමකට නොබැඳි සිටිය යුතු වුව ද, ප්‍රතිපාදන ඉක්මවා සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයයන් 13ක් යටතේ රු.2,086,431ක් බැඳීම් හා බැරකම් ලෙස එළඹ තිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

3.4 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	

i. 3.1 වගන්තිය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාලසීමාවකින් පසුව හෝ කිලෝ මීටර් 25000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.
ii. 3.3 වගන්තිය	වක්‍රලේඛය ප්‍රකාරව ඇමුණුමේ ආකෘතිය පරිදි වාහන සම්බන්ධයෙන් සටහනක් පවත්වාගෙන යායුතු වුවත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

i. මු.රෙ.104 (4)	නැතිවීම්/හානිවීම් සම්බන්ධයෙන් අලාභය සිදුවූ දිනයේ සිට තුන්මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, වාහන අනතුරු 7කට අදාළ වාර්තා ඉදිරිපත්කර නොතිබුණි.
ii. මු.රෙ. 156(ආ)	රජය විසින් තමා වෙත නිකුත් කරන ලද හෝ තමා භාරයේ තබාගැනීමට දෙන ලද්දා වූ දේපලක් සුරක්ෂිතව තබාගැනීම, නිසිපරිදි පාවිච්චි කිරීම සම්බන්ධ සියලුම අවස්ථාවල වගකිව යුතු වේ. එසේ වුව ද, වාහන අනතුරු දෙකක් සම්බන්ධයෙන් නීතිමය කටයුතු අවශ්‍ය නොවන බව පොලිසිය වෙත රියදුරු විසින් පැමිණිලිකර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

i. 5.4.8 වගන්තිය	කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුම උල්ලංඝනය කළහොත් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා ඇස්තමේන්තු කොන්ත්‍රාත් මුදලින් සියයට 5කට නොඅඩු මුදලක් කාර්යසාධන සුරක්ෂණයක් ලෙස ලබා ගතයුතු වුවත්, ICAO මෘදුකාංග ආශ්‍රිත සේවාවන් යාවත්කාලීන කිරීම සඳහා පෞද්ගලික ආයතනයට රු.24,800,000ක මුදලක් ගෙවා තිබුණු නමුත්, ඊට අදාළව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.
ii. 8.7.1 වගන්තිය	කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ අවසාන තීරණය ගනු ලැබූ විගස ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කළ යුතු වුවත්, ICAO මෘදුකාංග ආශ්‍රිත සේවාවන් යාවත්කාලීන කිරීම සඳහා වූ ප්‍රසම්පාදනයේදී එසේ සිදුකර නොතිබුණි.
iii. 8.9.3 වගන්තිය	අදාළ කාර්යයන් ලබාදුන් කොන්ත්‍රාත්කරු සමඟ විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වුවත්, ICAO මෘදුකාංග ආශ්‍රිත සේවාවන් යාවත්කාලීන කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

3.5 තැන්පතු

මු.රෙ. 571(1) ප්‍රකාරව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදී ම ඉකුත් වූ සියලු තැන්පතු පිළිබඳව ලැයිස්තුවක් පිළියෙල කළ යුතු වුව ද, එසේ සිදුකර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) අංක අමප/16/0738/703/033 දරන 2016 මැයි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික ප්‍රවාහන බලඇණියක් මාලි රාජ්‍ය තුළ ස්ථාපිත කිරීමට හා ඒ සඳහා අවශ්‍ය අවිආයුධ, සන්නද්ධ රථ, ප්‍රවර්ථන වාහන, සන්නිවේදන උපකරණ ඇතුළු අනෙකුත් උපකරණ මිලදීගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණු අතර, සාමසාධක රාජකාරී සඳහා නිලධාරීන් යෙදවීම තුළින් විදේශ විනිමය උපයා ගැනීම, නිලධාරීන්ගේ නිපුණතා සංවර්ධනය, ජාත්‍යන්තර වශයෙන් අත්දැකීම් ලබාගැනීම, නිලධාරීන්ගේ ආර්ථික තත්ත්වය ශක්තිමත්කර ජීවන තත්ත්වය ඉහළ නැංවීම වැනි කරුණු අරමුණු කරගෙන ව්‍යාපෘතිය ආරම්භකර තිබුණි. එසේම 2017 අගෝස්තු 30 දිනැති අංක අමප/17/1811/748/001-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රුපියල් මිලියන 1175.64ක් සඳහා අනුමැතිය ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු. 1,872,800,823ක වියදම් දරා තිබුණු අතර, අංක අමප/24/1788/626/023 දරන 2024 සැප්තැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නියම කිරීමට තීරණයකර තිබුණි. තව ද, අංක MF/NB/CM/222/2024/189/06 දරන 2024 සැප්තැම්බර් 06 දිනැති මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සටහනට අනුව 2024 සැප්තැම්බර් 06 දින වන විට රුපියල් මිලියන 2000කට ආසන්න වියදමක් දරා ඇති මෙම ව්‍යාපෘතිය තුළින් රජයට නිසි ප්‍රතිලාභයක් අත්වී නොතිබුණි.

(ආ) සාමසාධක පොලිස් බලමුළුව එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා පිටත් කිරීමට අවශ්‍ය Rapid Deployment Level – (RDL) මට්ටම සම්පූර්ණකර නොතිබුණු අතර, ඒ සඳහා Assessment of operational Capability (AOC) හා Verification Visit (VV) පරීක්ෂණ අවසන් කළ යුතු වුවත්, මෙම වාර්තාවේ දින තෙක් පරීක්ෂණ අවසන්කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදීගන්නා ලද රු.1,264,019,078ක් වටිනා වාහන 53ක් 2018 වර්ෂයේ සිට විගණිත දිනය දක්වා කඳවුරු 17ක ගාල්කර තිබුණු අතර, එම වාහන නඩත්තු කටයුතු සඳහා 2024 දෙසැම්බර් 31 දක්වා දරා ඇති වියදම රු.3,018,272ක් විය.

(ඇ) ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ පුහුණු පාඨමාලා 28ක් පවත්වා ඇති අතර, ඒ සඳහා විශේෂ කාර්යය බලකායේ වැය ශීර්ෂය මගින් හා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුබද්ධිත ආයතන මගින් අනුග්‍රහය දක්වා ඇතත්, දරන ලද වියදම විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ කටයුතු කරනු ලබන ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර මිලියන 05ක් මිලදීගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.1(ඇ) ප්‍රකාරව ලංසු කැඳවීම සඳහාදී ඇති කාලය, ලංසු පිළියෙල කිරීම සඳහා සාධාරණ ලෙස ප්‍රමාණවත් විය යුතු වුවත්, සැපයුම්කරුවන් සඳහා ලංසු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් සාධාරණ කාලයක් ලබාදී නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදනය කිරීමට ඇති භාණ්ඩ හෝ වැඩ සඳහා වන පිරිවිතර අදාළ ප්‍රසම්පාදන අරමුණ සාක්ෂාත්කර ගැනීම සඳහා, අවශ්‍ය ප්‍රමාණයට වඩා පටු ආකාරයට විස්තර නොකළ යුතු ය. රටවල් අතර තොරතුරු හුවමාරුකර ගැනීමට හැකිවන පරිදි විද්‍යුත් ගමන් බලපත්‍ර හඳුන්වාදීමේදී PKI(Public Key Infrastructure) අත්‍යාවශ්‍යම ප්‍රධාන අංගයක් බව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිරීක්ෂණයකර ඇති අතර, ඒ අනුව මෙම ප්‍රසම්පාදනයට අදාළ මුල් ලංසු ලේඛනයෙහි Volume 02, Section IV (2)(C) මඟින් ලංසුකරු විසින් සේවායෝජක සමඟ PKI යටිතල පහසුකම් නිර්මාණය කළ යුතු අතර, මෙම කොන්ත්‍රාත්තුවේ කොටසක් ලෙස සේවා යෝජකයන්ගේ වෙබ් අඩවියේ ඉල්ලා සිටින සියලුම සංරචක ස්ථාපනය හා පරීක්ෂා කිරීම සිදුකළ යුතු බව දන්වා තිබුණි. නමුත් 2023 දෙසැම්බර් 12 දිනැති අංක DIE/PRO/03/2022/20 ලිපිය ප්‍රකාරව මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතු කමිටු රැස්වීමකින් PKI යටිතල පහසුකම් සැපයීම වෙනමම ප්‍රසම්පාදනයක් ලෙස සිදුකිරීමට තීරණයකර තිබුණි. එම තීරණය මත උක්ත සංරචකය තාක්ෂණික පිරිවිතරයන් තුළින් ඉවත් කිරීමට තීරණයකර තිබුණි. ඒ අනුව අතිරේක 01 මඟින් මුල් ලංසු ලියවිලිවල Volume 02 Section VI 2 (C) ඉවත්කර තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

(අ) ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි (SA-82) ආරම්භක ශේෂය සඳහා ගැළපීම් ලෙස රු.469,415,000 දක්වා තිබුණු අතර, ඒ තුළ කෙරිගෙන යන ගොඩනැගිලි සහ ව්‍යුහයන් සඳහා වූ රු.22,014,287ක්, ප්‍රවාහන උපකරණ සඳහා

වූ රු.137,100,000ක් සහ රු.86,955,366ක් වූ වෙනත් යන්ත්‍රෝපකරණ සහ උපකරණවලට අදාළ තහවුරු කිරීම් විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) විශේෂ කාර්ය බලකායට අයත් වාහන 8ක් අලුත්වැඩියාව සඳහා ගරාජ වෙත යොමුකර 2024 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 සිට 3 දක්වා කාලයක් ගතවී තිබුණ ද, වාහනවල අලුත්වැඩියාව අවසන්කර ධාවනය සඳහා එක්කර නොතිබුණි.

4.4 රජයේ නිලධාරීන් ඇපකැබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප තැබිය යුතු රජයේ නිලධාරීන්ගේ ඇපආඥා පනතේ 612 වන අධිකාරිය අනුව ඇප තැබිය යුතු වන අතර, මුදල් රෙගුලාසි 881 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරියෙකු එකී තනතුරට පත්කළ දිනයේ සිට හෝ එවැනි තනතුරකට මාරුකළ දිනයේ සිට දෙමසක් ඇතුළත ඇප තැබීම කළ යුතු වුවත්, අමාත්‍යාංශයේ නිලධාරීන් 19 දෙනෙකුගෙන් ඇපමුදල් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

4.5 පාඩු හා හානි

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට මූ.රෙ.109 ප්‍රකාරව කටයුතු නොකරන ලද රු.45,136,076ක වටිනාකමක් සහිත කපානොහළ හානිවීම් පැවති අතර, ඒ තුළ වර්ෂ 10 ඉක්මවූ වාහන අනතුරු 03කට අදාළ කපානොහළ රු.1,768,477ක ශේෂයක් ද, වර්ෂ 05ත් 10ත් අතර වාහන අනතුරු 5කට අදාළ රු.4,180,534ක ශේෂයක් හා වර්ෂ 02 හා 05 අතර වාහන අනතුරු 17කට අදාළ රු.11,053,645ක ශේෂයක් ද පැවතුණි.

(ආ) පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශනයෙහි (සටහන 02) වර්ෂය තුළ පොතෙන් කපාහැරීම් ලෙස වාහන අනතුරු ඇතුළු වෙනත් හානිවීම් 20කට අදාළ රු.21,252,831ක මුදලක් කපාහැරීම් ලෙස දක්වා තිබුණ ද, ඉන් රු.9,327,740ක් අනුමැතියකින් තොරව කපාහැර තිබුණි.

4.6 අනාර්ථික ගනුදෙනු

පුද්ගල අනන්‍යතාවය සඳහා වූ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ විදුලි බිල්පත්වලට නියමිත කාලයේදී මුදල් නොගෙවීම නිසා හිඟ විදුලි බිල්පත්වලට අදාළව අධිභාර වශයෙන් රු.218,786ක මුදලක් ගෙවා තිබුණි.

4.7 කළමනාකරණ දුර්වලතා

(අ) නිලධාරීන් මියයාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම, සේවය හැරයාම සහ අනෙකුත් හේතු මත දැනට අමාත්‍යාංශයේ සේවයේ නොමැති නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට අයවිය යුතු වර්ෂ 1 සිට වර්ෂ 10ට වඩා වැඩි ණයශේෂ එකතුව රු.711,648ක් විය.

(ආ) පුද්ගල අනන්‍යතාවය සඳහා වූ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන එක් එක් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු සහ එක් එක් ආයතන භාවිතා කරන ලද විදුලි ඒකක ගණන අනුව ගෙවිය යුතු විදුලි ගාස්තු නිරවුල්කර නොමැතිවීමෙන් එක් එක් ආයතනවලින් ලැබිය යුතු විදුලි ගාස්තුවලට අදාළව ගණනය කරන ලද වාර්තා අනුව 2024 දෙසැම්බර් 31 දිනට මාස 01 සිට මාස 18 දක්වා කාලයකට අදාළව රු.12,613,858ක විදුලි ගාස්තුවක් නිරවුල් කිරීමට ඇත.

(ඇ) රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය.

i. 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනතේ 9 (ඇ) වගන්තිය ප්‍රකාරව සෑම අවුරුද්දකටම යටත් පිරිසෙයින් එක්වරක්වත් නියමිත ආකාරයට රාජ්‍ය නොවන සංවිධානයේ ගිණුම් විගණනය කිරීමට සැලැස්විය යුතු වුව ද, 2023 වර්ෂයේ ක්‍රියාකාරී මට්ටමේ පවතින රාජ්‍ය නොවන සංවිධාන 625න් විගණනය කරන ලද මූල්‍ය වාර්තා ඉදිරිපත්කර ඇත්තේ සංවිධාන 123ක් පමණි. මීට අමතරව රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයට වාර්ෂිකව ලබාදිය යුතු ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තා, වාර්ෂික වාර්තා හා වත්කම් වාර්තා යාවත්කාලීනව ලබාදීම ඉතා අඩු මට්ටමක පැවතුණි.

ii. 2024 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ලියාපදිංචි වී ඇති සංවිධාන පිළිබඳව ලැබී ඇති පැමිණිලිවලින් දැනට නොවිසඳී ඇති පැමිණිලි 12ක් පවතී.

(ඈ) නැතිවීම් හානිවීම් සම්බන්ධ මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තා සහ මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පූර්ණ වාර්තා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත ඉදිරිපත්කර එහි පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එම වාර්තාවල පිටපත් ඉදිරිපත්කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය

i. මහජන ආරක්ෂක අමාත්‍යාංශය

සේවක වර්ගය	අනුමත සංඛ්‍යාව	සේවක සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම		22		17		05
තෘතියික මට්ටම		06		01		05
ද්විතියික මට්ටම		414		352		62
ප්‍රාථමික මට්ටම		34		30		04
එකතුව		476		400		76

අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 16ක් පුරප්පාඩු පැවතීම අමාත්‍යාංශ කටයුතු පවත්වාගෙන යෑමට බාධාවක් වී තිබුණු අතර, උක්ත පුරප්පාඩු තුළ අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ඉ.සේ), අධ්‍යක්ෂ (සැලසුම/ශ්‍රී.ලං.ප.සේ) හා අභ්‍යන්තර විගණක (ශ්‍රී.ලං.ග.සේ) යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු අන්තර්ගත විය. පරිපාලන නිලධාරී, දෙමළ භාෂා පරිවර්තක, සංවර්ධන නිලධාරී හා රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 60ක්, පුරප්පාඩුව පැවතුණි.

ii. විශේෂ කාර්ය බලකාය

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව	අතිරික්ත සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	75	47	28	-
තෘතියික මට්ටම	347	377	-	30
ද්විතියික මට්ටම	10413	7134	3279	-
ප්‍රාථමික	635	490	145	-
එකතුව	11470	8048	3452	30

- නියෝජ්‍ය පොලිස්පති තනතුරු 02ක්, කාන්තා පොලිස් පරීක්ෂක තනතුරු 07ක් මහසැරයන් තනතුරු 37ක් සහ මහසැරයන් රියදුරු තනතුරු 08ක් ලෙස අනුමත තනතුරු සංඛ්‍යාව වූ 54ක ප්‍රමාණයම සියයට 100ක්ම පුරප්පාඩු වී පැවතුණි.

- සහකාර පොලිස් අධිකාරී තනතුරේ 44ක් වූ, අනුමත තනතුරු සංඛ්‍යාවෙන් පුරප්පාඩු 24ක් පැවති අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 55ක් විය.
- උපපොලිස් පරීක්ෂක තනතුරේ අනුමත සංඛ්‍යාව 812ක් වුව ද, පුරප්පාඩු 266ක් පැවති අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 33ක් විය.
- පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාව 6999ක් වුව ද, පුරප්පාඩු 2814ක් පැවති අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 40ක් විය.
- කාන්තා පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාව 163ක් වුව ද, පුරප්පාඩු 86ක් පැවති අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 53ක් විය.
- කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලධාරින් දෙදෙනෙකු, පොලිස් පරීක්ෂක නිලධාරින් 49දෙනෙකු, පොලිස් සැරයන් නිලධාරින් 377දෙනෙකු හා පොලිස් සැරයන් රියදුරු නිලධාරින් 30දෙනෙකු අතිරික්තව සේවයේ යෙදී තිබුණි.

iii. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	06	02	04
තෘතියික මට්ටම	-	-	-
ද්විතියික මට්ටම	66	53	13
ප්‍රාථමික මට්ටම	05	03	02
එකතුව	**77**	**58**	**19**

ආයතනය සඳහා වූ 77ක අනුමත කාර්ය මණ්ඩලයෙන්, 19දෙනෙකු එනම් සියයට 27ක් පුරප්පාඩු පැවති අතර, ඒ තුළ අධ්‍යක්ෂ ජනරාල් තනතුර, සහකාර අධ්‍යක්ෂ තනතුරු 03ක්, ගණකාධිකාරී, සංවර්ධන නිලධාරි/සංවර්ධන සහකාර තනතුරු 11ක් සහ රියදුරු තනතුරු 03ක් ද අන්තර්ගත විය.

(ආ) 2001 අගෝස්තු 22 දිනැති 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 05ක් එකම සේවා ස්ථානයෙහි සේවයකර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබාදිය යුතු වුවත්, අමාත්‍යාංශය තුළ වර්ෂ 05ක සිට වර්ෂ 11කට වැඩි කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරින් 18 දෙනෙකු සඳහා ස්ථාන මාරු ලබාදීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ VII (12:2:3) වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමට පත්කරනු ලබන තනතුර පූර්ණ කාලීන වූ ද, ළඟදීම පූර්ණකාලීන නිලධාරියෙකු පත්කිරීමට අදහස්කර ඇත්තා වූ ද, තනතුරක් විය යුතු වුව ද, පරිපාලන නිලධාරි තනතුර සඳහා නිත්‍ය නිලධාරියෙකු පත්නොකර වර්ෂ 4කට වැඩි කාලයක් වැඩබැලීමේ රාජකාරී ඉටුකිරීම සඳහා එක් නිලධාරියෙකු පත්කර තිබුණි.

යූ.එන්. අලුත්ගේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මුල්‍ය ප්‍රකාශන / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මුල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිලිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව,සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරනය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරන චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම. මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල නොවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අදාල නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16.	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3	2007.09.20 දිනැති MSD චක්‍රලේඛ 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ		
17.	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18.	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත			

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධක ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිලියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		